# දරුවන් ඇතිදැඩි කිරීම

**දිනය: 1448 රබීඋල් අව්වල් 29 / 2026 සැප්තැම්බර් 11**

සියලු ප්‍රශංසා අල්ලාහ්ට හිමිවේ. අපි ඔහුව ප්‍රශංසා කරමු, ඔහුගෙන් උපකාර සහ ක්ෂමාව අයැද සිටිමු. අපගේ ආත්මයන්ගේ අයහපතෙන් සහ අපගේ වැරදි ක්‍රියාවලින් ආරක්ෂා වන ලෙස අපි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමු. අල්ලාහ් යහමග පෙන්වූ අයෙකුව කිසිවෙකුටත් මුලා කළ නොහැක. ඔහු මුලා වීමට හැරගිය අයෙකුව යහමගට ගැනීමටද කිසිවෙකුට නොහැක. අල්ලාහ් හැර වෙනත් නැමදීමට සුදුස්සෙකු නොමැති බවත්, ඔහු ඒකීය බවත්, ඔහුට සහකරුවෙකු නොමැති බවත් මම සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ ගැත්තා සහ රසූල්වරයා (තූතයා) වන බවටද, ඔහුගේ මැවීම් අතරින් තෝරාගත් උතුම් මිතුරා වන බවටද මම සාක්ෂි දරමි. එතුමාණන් අමානතය ඉටු කළහ, ධර්ය ප්‍රචාරය කළහ, අල්ලාහ්ගේ මාගර්යේ කැපවීමෙන් කටයුතු කළහ. උන්වහන්සේට, උන්වහන්සේගේ පවුලේ අයට සහ සහාබාවරුන්ට අල්ලාහ්ගේ ශාන්තිය සහ ආශීවර්ාදය හිමිවේවා!

{විශ්වාස කළවුනි! අල්ලාහ්ට බිය විය යුතු අයුරින් බිය වන්න. තවද නුඹලා මුස්ලිම්වරුන් ලෙස මිස මරණයට පත් නොවන්න.} [ආල් ඉම්රාන්: 102]

**පසුව:**

සැබැවින්ම වඩාත්ම සත්‍යවාදී ප්‍රකාශය අල්ලාහ්ගේ ධමර්යයි (කුආර්නයයි). හොඳම මගපෙන්වීම මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ මගපෙන්වීමයි. නරකම දේ (ආගමේ) අලුතින් ඇති කළ දේවල්ය. සෑම අලුතින් ඇති කළ දෙයක්ම බිද්අතයක් (ආගමික විපරීතයක්) වන අතර, සෑම බිද්අතයක්ම මුලාවකි. සියලු මුලාවන්හි කෙළවර නිරයයි.

**අල්ලාහ්ගේ ගැත්තනි:**

සැබැවින්ම දරුවන් යනු අල්ලාහ්ගේ උතුම් නියමයක් සහ දානයකි. ඔහු කැමති අයට එය පිරිනමයි. අල්ලාහ් මෙසේ පවසයි: *{අල්ලාහ් නුඹලාගේම ආත්මයන්ගෙන් නුඹලාට සහකාරියන් ඇති කළේය. නුඹලාගේ සහකාරියන්ගෙන් නුඹලාට දරුවන්ද, මුනුබුරන්ද ඇති කර, පිරිසිදු දෙයින් නුඹලාට පෝෂණය ලබා දුන්නේය.} [අන්-නහ්ල්: 72].*

දරුවන් යනු ජීවිතයේ අලංකාරය සහ ප්‍රීතියයි. ඔවුන්ගේ යහපත්කම නිසා දෙනෙත් සැනසේ, සිතට සහනය සහ සතුට ලැබේ. එම නිසාම රහ්මාන්ගේ (අල්ලාහ්ගේ) ගැත්තන් මෙසේ ප්‍රාථර්නා කරති:

*{අපගේ පරමාධිපතියාණෙනි! අපගේ සහකාරියන්ගෙන්ද අපගේ දරුවන්ගෙන්ද අපට දෙනෙත් සැනසීම ලබා දෙනු මැනව! තවද බියබැතිමතුන්ට අපව නායකයින් කරනු මැනව!}*

*[අල්-ෆුකර්ාන්: 74].*

අල්ලාහ් තම ගැත්තෙකුට දෙන උතුම්ම තව්ෆීක් (සාඵර්කත්වය) නම්, ඔහුගේ ලෙයින් උපදින දරුවා අල්ලාහ්ට පමණක් නැමදීමයි. තම දරුවා තමා ඉදිරියේ සලාතය ඉටු කරනවාත්, කුආර්නය පාරායනය කරනවාත් දකින විට දෙමාපියන්ගේ සිත් සතුටින් පිරී යයි. මන්ද දරුවන්ගේ යහපත්කම යනු උතුම් අපේක්ෂාවක් සහ අල්ලාහ්ගේ කරුණාවකි.

**සහෝදර මුඃමින්වරුනි:**

දරුවන් ඇතිදැඩි කිරීම විශාල වගකීමක් සහ බැරෑරුම් කායර්යකි. විශේෂයෙන්ම වතර්මාන යුගයේ අප මුහුණ දෙන අභියෝග හමුවේ මෙය ඉතා වැදගත් වේ. නිසි අධ්‍යාපනය සහ යහපත් හැදියාව සඳහා ඉවසීම, ප්‍රඥාව සහ පරිණතභාවය අවශ්‍ය වේ. අද දින දරුවන් ඇතිදැඩි කිරීම අතීතයට වඩා වෙනස්ය. ක්‍රමවේදයන් වෙනස් වී ඇත, බලපෑම් වැඩි වී ඇත, අභියෝග වේගවත් වී ඇත. අද දරුවා ජීවත් වන්නේ විවෘත ලෝකයකය. ඔහු දෙමාපියන්ගෙන් අසනවාට වඩා වැඩි දෙයක් තාක්ෂණික මාධ්‍යයන් හරහා අසයි, දකියි, එයින් බලපෑමට ලක්වේ. එම නිසා වතර්මානයේ දරුවන් ඇතිදැඩි කිරීම යනු දිනපතා කරන ජිහාදයක් සහ කැපවීමකි.

අල්ලාහ් මෙසේ පවසයි: *{විශ්වාස කළවුනි! නුඹලාගේ ආත්මයන්ද, නුඹලාගේ පවුලේ අයද මිනිසුන් සහ ගල් දර වන නිරයෙන් ආරක්ෂා කරගන්න.} [අත්-තහ්රීම්: 6].*

ඉබ්නු කසීර් (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පවසයි: "එහි අථර්ය නම්, ඔවුන්ට යහපත අණ කරන්න, අයහපතින් වළක්වන්න, ඔවුන්ව අතහැර දමන්න එපා, එසේ වුවහොත් විනිශ්වය දිනයේදී ඔවුන්ව නිරය විසින් දවාලනු ඇත."

**භාග්‍යවන්තයිනි:**

අභියෝගාත්මක කාලයක දරුවන් ඇතිදැඩි කිරීමට උපකාරී වන විශාලතම දෙයක් නම්: ඔවුන්ගේ කුඩා කාලයේ සිටම ඔවුන්ගේ සිත් තුළ විශ්වාසය (ඊමානය) තැන්පත් කිරීමයි. මන්ද සිත ඉමානයෙන් පිරුණු විට, ශරීරයේ අවයව ඍජු වේ, හැසිරීම යහපත් වේ, තමා දෙස කෙනෙකු බලා සිටින බව දරුවාට ස්වයංක්‍රීයවම දැනේ. එවිට නිරීක්ෂකයෙකු නොමැති වුවද ඔහු නිවැරදි මාගර්යේ ගමන් කරයි.

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා මෙසේ පවසයි: "දිනක් මම රසූලුල්ලාහ් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් පිටුපසින් සිටියෙමි. එවිට උන්වහන්සේ මෙසේ පැවසූහ: 'දරුවා, මම ඔබට වචන කිහිපයක් උගන්වමි: අල්ලාහ්ව ආරක්ෂා කරන්න (ඔහුගේ නියෝග පිළිපදින්න), ඔහු ඔබව ආරක්ෂා කරනු ඇත. අල්ලාහ්ව ආරක්ෂා කරන්න, ඔහු ඔබ ඉදිරියේ සිටිනු ඔබට පෙනෙනු ඇත. ඔබ ඉල්ලන්නේ නම් අල්ලාහ්ගෙන්ම ඉල්ලන්න. ඔබ උපකාර පතන්නේ නම් අල්ලාහ්ගෙන්ම උපකාර පතන්න. සමස්ත සමාජයම එකතු වී ඔබට කිසියම් යහපතක් කිරීමට උත්සාහ කළද, අල්ලාහ් ඔබට ලියා ඇති දෙයක් මිස වෙනත් කිසිවක් කිරීමට ඔවුන්ට නොහැක. ඔවුන් සියල්ලන්ම එකතු වී ඔබට යම් හානියක් කිරීමට උත්සාහ කළද, අල්ලාහ් ඔබට ලියා ඇති දෙයකින් මිස වෙනත් කිසිවකින් හානි කිරීමට ඔවුන්ට නොහැක. පෑන ඔසවන ලදී, පත්‍රිකා වියළී ගියේය.'" *(තිමරීදි).*

**සහෝදර මුඃමින්වරුනි:**

දියණියන් සහ පුතුන් ඇතිදැඩි කිරීමේදී ප්‍රයෝජනවත් වන තවත් ක්‍රමයක් නම්: කුඩා කල සිටම අණපනත් පිළිපදීමටත්, තහනම් සහ අයහපත් දේවලින් ඈත්වීමටත් ඔවුන්ව හුරු කිරීමයි. අල්ලාහ් මෙසේ පවසයි:

*{නුඹගේ පවුලේ අයට සලාතය ඉටු කරන ලෙස අණ කරන්න. තවද එහි ස්ථාවරව සිටින්න. අපි නුඹෙන් ජීවනෝපාය ඉල්ලන්නේ නැත, අපි නුඹට පෝෂණය දෙන්නෙමු. අවසාන ජයග්‍රහණය බියබැතිමත්භාවයටමය.} [තාහා: 132].*

තවද අල්ලාහ් තම ගැත්තෙකු වූ ලුක්මාන් (අලෙයිහිස්සලාම්) තුමා තම පුතුට දුන් උපදේශය ගැන මෙසේ පවසයි:

*{මගේ පුතණුවනි! සලාතය ඉටු කරන්න, යහපත අණ කරන්න, අයහපතින් වළක්වන්න, ඔබට සිදුවන කරදර හමුවේ ඉවසන්න. සැබැවින්ම එය අධිෂ්ඨානශීලී කායර්යන්ගෙන් එකකි.} [ලුක්මාන්: 17].*

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හුමා) තුමා පවසන්නේ රසූලුල්ලාහ් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූ බවයි: "ඔබගේ දරුවන්ට අවුරුදු හතක් වන විට සලාතය ඉටු කිරීමට අණ කරන්න. අවුරුදු දහයක් වන විට (එය නොකරන්නේ නම්) ඒ වෙනුවෙන් පහර දෙන්න, තවද ඔවුන්ගේ නින්දේදී ඈඳන් වෙන් කරන්න." *(අබූ දාවූද්, තිමරීදි).*

එපමණක් නොව, නබිතුමා (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) කුඩා දරුවන් ගැන විශේෂ අවධානයක් යොමු කළ අතර ඔවුන්ගේ තත්ත්වයන් ගැන විමසිලිමත් විය. දරුවන් සමඟ උන්වහන්සේගේ ක්‍රමවේදය පදනම් වූයේ කරුණාවෙන් සහ ආදරයෙන් විමසා බැලීම මතය. දරුවාට සලාතයේ වැදගත්කම දැනවීම සඳහාත්, එයට හුරු කිරීම සඳහාත්, අල්ලාහ් සමඟ ඇති සබඳතාව ගොඩනැගීම සඳහාත් උන්වහන්සේ කුඩා දරුවාගේ සලාතය ගැන විමසා සිටියහ. ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා මෙසේ පවසයි: "මම මගේ පුංචි අම්මා වන මයිමූනාගේ නිවසේ රාත්‍රිය ගත කළෙමි. සවස රසූලුල්ලාහ් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් පැමිණ, 'දරුවා සලාතය ඉටු කළාද?'යි ඇසූහ. පිරිස, 'ඔව්' යැයි පැවසූහ." *(අබූ දාවූද්).*

නබිතුමාගේ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) උපදෙස් බාහිර නැමදුම්වලට පමණක් සීමා නොවූ අතර, ආහාර ගැනීම සහ බීම වැනි දෛනික ජීවිතයේ සියුම් අනුගමනයන් සහ යහපත් සිරිත් විරිත් දක්වාද පැතිර ගියේය. උමර් ඉබ්නු අබී සලමා (රළියල්ලාහු අන්හුමා) තුමා මෙසේ පවසයි: "මම රසූලුල්ලාහ් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ භාරකාරත්වයේ සිටි කුඩා දරුවෙකු වීමි. ආහාර බඳුනේ මගේ අත සෑම දෙසටම ගියේය. එවිට රසූලුල්ලාහ් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මට මෙසේ පැවසූහ: 'දරුවා, අල්ලාහ්ගේ නාමය සිහි කරන්න (බිස්මිල්ලාහ් කියන්න), දකුණු අතින් අනුභව කරන්න, ඔබට ආසන්නයෙන් අනුභව කරන්න.' ඉන්පසුව මගේ ආහාර ගැනීමේ රටාව සෑමවිටම එයම විය." *(බුකාරි, මුස්ලිම්).*

**සහෝදර මුස්ලිම්වරුනි:**

අපගේ කාලයේ දරුවන් ඇතිදැඩි කිරීම නාස්ති කළ ප්‍රධානතම ප්‍රකාශයක් නම්: "ඔහුට ඉඩ දෙන්න, ඔහු තවම කුඩා දරුවෙකි" යන්නයි. මෙය වැරදි සාධාරණීකරණය කරන, උපදෙස්වල ආලෝකය නිවා දමන, සහ නොසැලකිලිමත්කමට දොරටු විවර කරන වචනයකි. එහි ප්‍රතිඵලයක් ලෙස දරුවා තමාට කැමති ඕනෑම දෙයක් කරන අතර කිසිවෙකු ඔහුව තහනම් කරන්නේ නැත. දියණිය තමාට කැමති ඕනෑම ඇඳුමක් අඳින අතර කිසිවෙකු එයට විරුද්ධ වන්නේ නැත. අවසානයේ පරම්පරාවක් වැරදි මත වැඩෙයි, නොසැලකිලිමත්කමට හුරු වෙයි, කියන කිසිවක් ගණන් ගන්නේ නැත. නමුත් කුඩා කල යහපත්ව වගා කරන ලද තැනැත්තාගේ ජීවිතය, මහලු වියේදී පිපී බැබළෙයි.

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසයි: "හසන් ඉබ්නු අලි (රළියල්ලාහු අන්හුමා) කුඩා දරුවෙකුව සිටියදී, සදකා (දන් දුන්) රටඉඳි වලින් එකක් ගෙන කටේ දමා ගත්තේය. එවිට නබිතුමා (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) එය කෙළ ගසා ඉවත් කිරීම සඳහා 'කික්, කික්' යැයි පවසා, 'අපි සදකා (සකාත්) දේවල් අනුභව නොකරන බව ඔබට තේරුණේ නැද්ද?' යැයි පැවසූහ." *(බුකාරි)*.

ඉබ්නු අල්-කය්යිම් (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පවසයි: "යමෙක් තම දරුවාට ප්‍රයෝජනවත් දේ ඉගැන්වීම නොසලකා හැර, ඔහුව නිකරුණේ අතහැර දමයිද, ඔහු තම දරුවාට කළ හැකි මහත් අසාධාරණය කර ඇත. බොහෝ දරුවන්ගේ නාස්තිය සිදුවන්නේ දෙමාපියන්ගේ නොසැලකිලිමත්කම සහ ඔවුන්ට ආගමේ ෆඃද් (අනිවාර්ය) සහ සුන්නත් දේවල් උගන්වන්නේ නැති කම නිසාය. ඔවුන් කුඩා කල දරුවන්ව නාස්ති කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දරුවන්ට තමන්ගෙන්ම ප්‍රයෝජනයක් නොවූ අතර, මහලු වියේදී ඔවුන්ගෙන් දෙමාපියන්ටද ප්‍රයෝජනයක් නොවීය."

*"යහපත් ගුණධර්ම යනු ශාකයක් වැනිය... එයට ගෞරවයේ ජලය වක්කළ විට වැවේ, මඟපෙන්වන්නා එය රැකබලා ගත් විට... එය ගුණධර්මවල කඳ මත පල දරමින් නැගී සිටියි."*

අල්ලාහ් මට සහ ඔබට ශ්‍රේෂ්ඨ වූ අල්-කුආර්නයෙන් ආශීර්වාද කරත්වා! එහි ඇති ආයත් සහ ප්‍රඥාවන්ත මතක් කිරීම් වලින් මට සහ ඔබට ප්‍රයෝජන ලබා දෙත්වා! මම මගේ මෙම ප්‍රකාශය කර, මගේද ඔබගේද සියලු පාපයන්ට අල්ලාහ්ගෙන් ක්ෂමාව අයැද සිටිමි. ඔබද ඔහුගෙන් ක්ෂමාව අයැද සිටින්න, ඔහු වෙත තව්බා (පශ්චාත්තාප) වන්න. සැබැවින්ම ඔහු අතිශයින් ක්ෂමා කරන්නාද, කරුණාන්විතද වේ.

**දෙවන දේශනාව**

අල්ලාහ්ගේ සියලු පරිත්‍යාගයන්ට උන්වහන්සේට ප්‍රශංසා හිමිවේ. උන්වහන්සේගේ අනුග්‍රහයන්ට සහ මඟපෙන්වීමට කෘතඥතාව පළ කරමු. උන්වහන්සේගේ තෘප්තිය වෙත ඇරයුම් කළ මුහම්මද් ඉබ්නු අබ්දිල්ලාහ් නබිතුමාණන්ටත්, උන්වහන්සේගේ පවුලේ අයටත්, සහාබාවරුන්ටත්, විනිශ්චය දිනය දක්වා උන්වහන්සේගේ මගගිය සැමටත් ශාන්තිය සහ ආශීර්වාදය හිමිවේවා!

**පසුව:**

අල්ලාහ්ගේ ගැත්තනි! අල්ලාහ්ට අවංක ලෙස බියබැතිමත් වන්න, රහසේදීත් ප්‍රසිද්ධියේදීත් ඔහුව නිරීක්ෂණය කරන්න, තවද ඔබ සියල්ලන්ම ඔහු වෙත රැස් කරනු ලබන බව දැනගන්න.

**සහෝදර මුස්ලිම්වරුනි:**

දරුවන් ඇතිදැඩි කිරීමට උපකාරී වන ප්‍රධාන ක්‍රමයක් නම්: **යහපත් ආදශර්යයි.** එය වචන නොමැතිව සිදුවන අධ්‍යාපනයකි, දරුවන්ගේ සිත් තුළ එය නිහඬව ක්‍රියාත්මක වේ. දරුවා තමා දකින යහපත් ගුණධමර් සහ නිවැරදි ආදශර්යන්ගෙන් බලපෑමට ලක්වෙමින් වැඩෙයි. එම නිසා දරුවාගේ හැසිරීමේ විපරීතභාවයට සහ ව්‍යාකූලත්වයට හේතුවන භයානකම දෙය නම්: දෙමාපියන්ගේ වචන සහ ක්‍රියා අතර ඇති පරස්පරතාවයි.

අල්ලාහ් තආලා තම නබිතුමාට (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තමාට පෙර සිටි නබිවරුන් සහ රසූල්වරුන් අනුගමනය කරන ලෙස අණ කළේය:

*{ඔවුන් අල්ලාහ් යහමග පෙන්වූ අය වෙති. එබැවින් ඔවුන්ගේ මගපෙන්වීම නුඹ අනුගමනය කරන්න.} [අල්-අන්ආම්: 90].*

තවද සමස්ත සමාජයටම උන්වහන්සේගේ සියලු වචන, ක්‍රියා සහ තත්ත්වයන්හිදී උන්වහන්සේව ආදශර්යට ගන්නා ලෙස උපදෙස් දුන්නේය:

*{සැබැවින්ම අල්ලාහ්ගේ රසූල්වරයා කෙරෙහි නුඹලාට යහපත් ආදශර්යක් විය. (එනම්) අල්ලාහ්වද අවසාන දිනයද අපේක්ෂා කරමින් අල්ලාහ්ව අධික ලෙස සිහිපත් කරන්නන්ටය.} [අල්-අහ්සාබ්: 21].*

යහපත් ආදශර්යක් පැවතීම යනු සමාජය ගොඩනැගීමේ ප්‍රධාන පදනමක් වන අතර, අන් අයට ප්‍රයෝජනවත් වන යහපත් පුද්ගලයන් බිහිකිරීමේ ප්‍රධාන හේතුවක් බව මෙයින් පැහැදිලි වේ.

**භාග්‍යවන්තයිනි:**

දරුවන් ඇතිදැඩි කිරීමේ වඩාත්ම සාථර්ක ක්‍රමයක් නම්: දරුවන්ගේ රුචිකත්වයන් පිළිබඳව අවධානයෙන් සිටීම, ඔවුන්ගේ සිත්වල ඇති දේ වටහා ගැනීම සහ ඔවුන් සමඟ සංවාදයේ දොරටු විවර කිරීමයි. එවිට බාධක ඉවත් වී, කතාබස් කිරීමේදී සහ සාකච්ඡා කිරීමේදී ඔවුන්ට ආරක්ෂාව දැනෙනු ඇත. මෙහිදී පියා හෝ මව මිතුරෙකුගේ ස්වරූපයෙන් සිටින භාරකරුවෙකු බවට පත්වේ. ඔවුන් ගෞරවය, ආදරය, මගපෙන්වීම සහ වැළඳගැනීම යන සියල්ල එකට එකතු කරයි.

ඉබ්‍රාහීම් (අලෙයිහිස්සලාම්) නබිතුමා සහ උන්වහන්සේගේ පුත් ඉස්මාඊල් (අලෙයිහිස්සලාම්) අතර සිදු වූ මෙම සංවාදය දෙස බලන්න:

*{ඔහු ඔහු සමඟ උත්සාහයෙන් කටයුතු කරන වයසට පත් වූ විට: 'මගේ පුතණුවනි! මම ඔබව කපා බිලි දෙන බව සිහිනයෙන් දකිමි, එබැවින් ඔබගේ අදහස කුමක්දැයි බලන්න' යැයි පැවසීය. (එයට පුතු) 'මගේ පියණුවනි! ඔබට අණ කරන ලද දේ ඉටු කරන්න, අල්ලාහ් කැමති නම් මාව ඉවසන්නන් අතර දකිනු ඇත' යැයි පැවසීය.} [අස්-සාෆ්ෆාත්: 102].*

තවද යූසුෆ් (අලෛයිහිස්සලාම්) නබිතුමා එම සිහිනය දුටු විට, තම රහස තම පියාට මිස වෙනත් කිසිවෙකුට පැවසුවේ නැත. මන්ද රහස් භාරදෙනු ලබන්නේ විශ්වාසය ඇති තැනැත්තාට පමණි:

*{යූසුෆ් තම පියාට: 'මගේ පියණුවනි! මම තාරකා එකොළහක්ද, සූර්යයා සහ චන්ද්‍රයාද දුටුවෙමි, ඔවුන් මට සුජූද් කරනු (ගෞරව කරනු) දුටුවෙමි' යැයි පැවසූ වේලාව සිහිපත් කරන්න.} [යූසුෆ්: 4].*

*"දෙමාපියන් ජීවිතයේ බරින් නිදහස් වී, තම දරුවා අසරණ කර මියගිය පමණින් දරුවා අනාථයෙකු වන්නේ නැත... (සැබෑ) අනාථයා නම්: නොසලකා හරින මවක් හෝ (තමා වෙනුවෙන්) කාලය නොමැති කාර්යබහුල පියෙකු සිටින දරුවාය."*

අල්ලාහ් දෙවියන් වහන්ස! ජීවත්ව සිටින සහ මියගිය සියලු මුස්ලිම් පිරිමින්ට සහ කාන්තාවන්ට ක්ෂමාව ලබා දෙනු මැනව! අපගේ පරමාධිපතියාණෙනි, අපෙන් දුක් කරදර, වසංගත, පීඩාවන් සහ දුෂ්කරතාවන් ඉවත් කරනු මැනව! අපට ඔබගේ ආශීර්වාදයන් අඛණ්ඩව ලබාදී, විපත් අපෙන් දුරු කරනු මැනව! අපගේ ආත්මයන් පිරිසිදු කරනු මැනව, එය පිරිසිදු කිරීමට හොඳම තැනැත්තා ඔබමය. අපගේ පරමාධිපතියාණෙනි, අපට මෙලොවදීද යහපත ලබාදී, මතුලොවදීද යහපත ලබාදී, නිරයේ වේදනාවෙන් අපව ආරක්ෂා කරනු මැනව!

අල්ලාහ් දෙවියන් වහන්ස! අපගේ නායකයාට (අමීර්වරයාට) සහ ඔහුගේ ඔටුන්න හිමි කුමරුට ඔබ කැමති සහ තෘප්තිමත් වන දේ කිරීමට තව්ෆීක් (ශක්තිය) ලබා දෙනු මැනව! ඔවුන්ගේ නළලෙන් අල්ලා යහපතට සහ බියබැතිමත්භාවයට යොමු කරනු මැනව! මෙම රටත්, සසුන්ගත සියලු මුස්ලිම් රටවල්ද ආරක්ෂිත, සන්සුන්, සුභසාධනයෙන් පිරුණු සහ සමෘද්ධිමත් ස්ථානයන් බවට පත් කරනු මැනව!

*ආදශර් සිකුරුදා දේශන සම්පාදනය කිරීමේ කමිටුව*